**මන්මුනේ දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**-------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 23 දින ද පසුගිය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 12 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මන්මුනේ දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**---------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) බදු කුලී ලෙජරය අනුව 2016 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු බදුකුලී හිඟ ශේෂය රු.3,102,927 ක් ලෙස දක්නට ලැබූ නමුත් මූල්‍ය ප්‍රකාශනයේ එය රු.1,735,767 ක් ලෙස දක්වා තිබුණි. එම නිසා අයකර ගත යුතු හිඟ බදු කුලී රු.1,367,160 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වෙළඳපොල කඩකුලී ලෙජරය අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී අයකළ යුතු හිඟ වෙළඳපොල කඩකුලී ශේෂය රු.1,096,325 ක් ලෙස දක්වා තිබුණත්, මූල්‍ය ප්‍රකාශනයේ එය රු.955,850 ක් ලෙස දක්වා තිබුණි. එම නිසා, අයකළ යුතු වෙළඳපොල කඩකුලී වටිනාකම රු.140,475 කින් අඩුවෙන් හෙළදරව් කර තිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**
**---------------------------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| **විෂයයන්** | **වටිනාකම** | **ඉදිරිපත් නොකළ සාක්ෂි** |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 113,084,827 | ඉඩම් ඔප්පු |
| යන්ත්‍රෝපකරණ | 1,809,578 | ස්ථාවර වත්කම් ලේඛනය |
| මෝටර් රථ හා වාහන | 11,886,590 | |

**1.3.3 නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග ආදිය ලේඛනගත කිරීම සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.15,595,655 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.30,429,948 ක් විය.

**2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

සභාව විසින් පවත්වාගෙන යනු ලබන මුදල් පොත ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ එක් එක් මාසය අවසානයේ රු.මිලියන 22.17 ක සිට රු.මිලියන 32.84 දක්වා වන පරාසයක මුදල් ශේෂයක් දක්නට ලැබුණි. මෙය පොලී ආදායමක් ලබාගත හැකි ස්ථාවර තැන්පතු හෝ ඒක්ෂණ තැන්පතුවල ආයෝජනය කර ආදායමක් ලබාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් සභාව විසින් වර්ෂයකට ආසන්න වශයෙන් රු.මිලියන 2.75 ක පොලී ආදායමක් අහිමි කරගෙන තිබුණි.

**2.3 ආදායම් කළමනාකරණය**

2016 දෙසැම්බර් 31 දිනට පැවැති රු.955,850 ක වෙළඳපොල කඩකුලී, රු.1,735,767 ක බදු කුලී, රු.673,800 ක වරිපනම් බදු සහ රු.19,310 ක බලපත්‍ර ගාස්තු හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාරයක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවේ සාමාජිකයෙකු විසින් සභාවෙන් 2009 වර්ෂයේදී කුලියට ලබාගත් බෝට්ටු යන්ත්‍රය සභාවට ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේදී UNDP ආයතනයෙන් පරිත්‍යාග වශයෙන් ලබාගෙන තිබූ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සභාවේ නමට අයිතිය මාරු කරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---

### 4.1 නිරවුල් නොකළ විගණන ඡේද

---

සභාව සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරනු ලැබූ විගණන ඡේදවලින් අනාවරණය කරනු ලැබූ අඩුපාඩු සහ ඌනතානවයන් සම්බන්ධයෙන් සභාව මේ දක්වා නිවැරදි කර නොතිබූ විගණන ඡේදවලට යොමුව පහත දැක්වේ.

| වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2015 | 2.2.2 | විදුලි පාරිභෝගිකයන්ගෙන් අයකර ගත යුතු මුදල් අය කර ගැනීමට වර්ෂ 29 ක කාලයක සිට කටයුතු කර නොතිබීම. |
| 2015 | 2.2.4 | ඇප මුදල් ලබාගත යුතු නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබීම. |

### 4.2 පද්ධති හා පාලන

---

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් |
|---|---|
| (අ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම.<br>(ii) භාවිතා නොකර නිෂ්කාර්යව පවතින වත්කම් සම්බන්ධයෙන් කටයුතු කිරීම. |